# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2222/2 - 2021 අප්‍රේල් මස 05 වැනි සඳුදා - 2021.04.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත**

3 ඇ වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 ඇ වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මඟින් මෙම පනතේ 3 ඇ වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද 2016 නොවැම්බර් මස 10 දිනැති අංක 1992/30 දරන *අති විශේෂ ගැසට්* නිවේදනයේ උපලේඛනයේ 8 වන වගන්තියට පසුව පහත නව වගන්තිය ඇතුළත් කරමින් සංශෝධනය කරමි.

"(9) ශ්‍රී ලංකා පොලීසිය අයත් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත භාණ්ඩාගාර ලේකම්වරයාගේ අනුමැතියට යටත්ව ශ්‍රී ලංකා පොලීසියට ත්‍රී රෝද රථ 2,000 ක් මිල දී ගැනීම සඳහා වන අංක 21/0515/332/005-II/TBR හා 2021 මාර්තු මස 18 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය පිළිබඳ වන 2021 මාර්තු මස 23 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණය අනුව ආනයනය කරන ලද ත්‍රී රෝද රථයක්"

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 අප්‍රේල් මස 05 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

04 - 619